# ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව

# පුරප්පාඩු දැන්වීමයි

ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව අඩු ආදායම්ලාභීන් සඳහා නීති ආධාර ලබාදීම මූලික කරගනිමින් 1978 අංක 27 දරන නීති ආධාර පනත මගින් සංස්ථාපනය කර ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

**තනතුර - නීති නිලධාරී (පුරප්පාඩු - 09 යි)**

(දකුණු පළාත - 01 / උතුරු පළාත - 03 / බස්නාහිර පළාත - 02 / මධ්‍යම පළාත - 01 / නැගෙනහිර පළාත - 01 / වයඹ - 01)

**සුදුසුකම්**

- ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු ලෙස දිවුරුම් දීමෙන් පසු වසර තුන (03) ක ක්‍රියාකාරී වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම.
- 2021.01.01 දිනට වයස අවුරුදු 28 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතුය.
- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
- තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

**රැකියාවේ වගකීම**

නීති ආධාර කොමිෂන් සභාවේ නීතිඥයෙකු වශයෙන් අධිකරණයේ කටයුතු කිරීම හා කොමිෂන් සභාව විසින් නීති නිලධාරියෙකු වශයෙන් පවරා දෙනු ලබන සියලු රාජකාරී ඉටු කිරීම.

**වැටුප් කේතය**

MM-1-1- රු. 53,175-10x1,375-15x1,910 - 95,575 + (කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි) + EPF / ETF

**තනතුර - කළමනාකරණ සහකාර (තාක්ෂණික නොවන) III ශ්‍රේණිය (පුරප්පාඩු 16 යි)**

(දකුණු පළාත - 01 / සබරගමුව පළාත - 02 / බස්නාහිර පළාත - 04 / මධ්‍යම පළාත - 03 / නැගෙනහිර පළාත - 02 / වයඹ පළාත - 03 / උතුරු පළාත - 01)

**අවශ්‍ය සුදුසුකම්**

01. 2021.01.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි වියයුතු අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය සහ සිංහල හෝ දෙමළ යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් සමත්වීම.
03. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය) හැර සමත්ව තිබීම.
04. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
05. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
06. පරිගණක සාක්ෂරතාවය පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. (සිංහල / දෙමළ / ඉංග්‍රීසි)

**රැකියාවේ වගකීම**

ආයතනයන්හි විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වුවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ නොවන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

වැටුප් කේතය

MA 1-2 : (27,910-10x300-7x350-12x600-12x710-49,080) + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි + EPF / ETF

**තනතුර - කළමනාකරණ සහකාර (තාක්ෂණික) III ශ්‍රේණිය**
**(පරිගණක තාක්ෂණ සහකාර) (පුරප්පාඩු 01 යි)**

**අවශ්‍ය සුදුසුකම්**

01. 2021.01.01 දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි වියයුතු අතර, ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී ගණිතය සහ සිංහල හෝ දෙමළ යන විෂයයන් ඇතුළුව විෂයයන් හතරකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් සමත්වීම.
03. අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් අවම වශයෙන් විෂයයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය) හැර සමත්ව තිබීම.
04. විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.
05. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
06. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගන්නා ලද කාර්මික හෝ වෘත්තීය පුහුණු ආයතනයකින් නිකුත් කරන ලද පරිගණක ක්ෂේත්‍රයෙහි ජාතික වෘත්තීය කුසලතා (NVQ) 05 වන මට්ටමට නොඅඩු මට්ටමක ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

**රැකියාවේ වගකීම**

ආයතනයන්හි විධායක හා පරිපාලන මට්ටම්වල නියුතු වුවන්ගේ කාර්යයන්ට උපස්ථම්භක හා / හෝ පහසුකාරක කර්තව්‍යයන් අතුරින් තාක්ෂණික ස්වභාවයේ වන්නා වූ කාර්යයන් මෙම සේවා ගණයට පැවරේ. මෙම ගණයේ කාර්යයන් අතුරින් පත්වීම් බලධාරියා විසින් සුවිශේෂී කොට දක්වනු ලබන කාර්යයන් මෙම සේවා ගණයට අයත් සේවකයින් විසින් ඉටු කරනු ලැබිය යුතුය.

**වැටුප් කේතය**

MA 2-2 : (30,310-10x300-7x350-4x600-20x710-52,360) + කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කර ඇති රජයේ දීමනා සහිතයි + EPF / ETF

(ලිඛිත පරීක්ෂණයකින් හා සම්මුඛ පරීක්ෂණයකින් අනතුරුව බඳවා ගැනීම සිදු කරනු ලැබේ)

(ඉහත සියලු තනතුරු සඳහා බඳවා ගැනීමෙන් පසු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අදාළ කාලයන්හිදී පෙනී සිටිය යුතු වේ)

ඉහත තනතුරු සඳහා අයදුම්පත් 2021 පෙබරවාරි 10 දිනට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න. ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ ඔබ විසින් අයදුම් කරනු ලබන තනතුර හා පළාත සඳහන් කිරීම අනිවාර්ය වේ)

**ලිපිනය :**

**සභාපති,**
**ශ්‍රී ලංකා නීති ආධාර කොමිෂන් සභාව,**
**මහාධිකරණ සංකීර්ණය, අලුත්කඩේ, කොළඹ 12.**